**අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**---------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 10 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර,සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.4,250,000ක් හා ප්‍රාග්ධන වියදම් රු.4,200,000ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ). ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ අගය රු.1,276,714ක් හා පුස්තකාල පොත්වල අගය රු. 467,217 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලබා දී තිබුණු වාහන 02ක පිරිවැය නිවැරදිව ගිණුම්ගත නොකර පෞද්ගලික වාහන වෙළඳාම් ආයතනයකින් ලබාගත් රු.8,723,220ක් වූ වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

(ඈ). පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.15,553,900ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 03ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඉ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු මුදලින් රු.1,694,807ක් පමණක් වැය කර, ඉතිරි මුදල එම අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබියදීත්, ඒ ගැන නොසළකා සාවද්‍ය ලෙස රු.2,305,193ක මුදලක් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.7,658,457ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,908,648ක ශේෂ 02ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් 04ක එකතුව රු.10,218,431ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,058,929ක් වූ ශේෂ 04ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

------------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,619,681ක් වූ ගිණුම් විෂයයන් 08කට අදාල ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.303,652ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.761,497ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.457,845ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් සමඟ ඉකුත් වර්ෂයේ තත්ත්වය සළකා බැලීමේදී ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් තත්ත්වයක් නිරීක්ෂණය විය. එමෙන්ම කාරක ප්‍රාග්ධනයේ අඛණ්ඩ අඩුවීමක්ද පෙන්නුම් කෙරෙන බැවින්, මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් එමඟින් පෙන්නුම් නොකෙරුණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු ජල ව්‍යාපෘති 07න් පාරිභෝගිකයන් 461 දෙනෙකු ජල පහසුකම් ලබා ගෙන තිබුණු නමුත්, ඉන් 378 දෙනෙකුට ජල මනු සවිකර නොතිබුණි. ඔවුන්ගෙන් රු.150ක ස්ථාවර මාසික ගාස්තුවක් අයකර තිබුණි. ජලමනු සවිකර ජල පරිභෝජනය අනුව ගාස්තු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ). කුඹල්ඔළුවේ ස්ථාපිත කර තිබුණු කුඩා ප්‍රමාණයේ ජල විදුලි බලාගාරයෙන් කිසිදු ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). සැලසුම් අනුමත කර නොගෙන සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු වෙනුවෙන් බලපත්‍ර නිකුත් කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.2 අක්කර බදු

හිඟහිටි අක්කර බදු ශේෂය රු.52,722ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 5ක කාලයක් ඉක්මවූ රු.13,785ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.3 ජල ගාස්තු

හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.197,485ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයක කාලයක් ඉක්මවූ රු.74,675ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.228,933ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.404,600ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය ඇගයීම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2011- 2015 වර්ෂ ආවරණය වන පරිදි සකස් කර තිබුණු සංයුක්ත සැලැස්මට මාර්ග අළුත්වැඩියා කිරීම පමණක් ඇතුළත් කර තිබුණි.

(ආ). නව ආදායම් උත්පාදන මාර්ග හඳුනාගෙන ආදායම් උපයා ගැනීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ උපයා තිබුණු මුළු ආදායම රු.7,748,685ක් වූ අතර, ඉන් ක්‍රියාත්මක ආදායම රු.450,959ක් වීමෙන් උත්පාදිත ආදායම මුළු ආදායමෙන් සියයට 6ක් තරම් අඩු අගයක් ගෙන තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉකුත් වර්ෂයේදී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය විසින් අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ලබා දී තිබුණු මිලියන රු. 07 ක මුදල අදාල සංවර්ධන කටයුතුවලට යොදා නොගැනීම නිසා ආපසු යැවීමට සිදු වී තිබුණි.

(ආ). 1992 වර්ෂයේදී යුධ හමුදාව භාරයට ගැනීමෙන් අනතුරුව සුන්බුන් වී සභාවට නැවත භාර දී තිබුණු පිරිවැය රු.312,500ක්වූ අංක 53-4723 දරන කැබ්රථය අළුත්වැඩියා

කර ධාවනයට යොදවා ගැනීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ). ප්‍රාදේශීය සභාව ශක්තිමත් කිරීම සඳහා පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.4,000,000ක මුදල වැය කිරීම කාලීනව සිදු නොවීම නිසා ව්‍යාපෘති 07ක් සඳහා වූ රු.1,245,780ක මුදලක් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

(ඈ). ප්‍රාදේශීය සභාව සතු පුස්සැල්ල පිහිටි පර්චස් 80ක් පමණ වූ කාර්යාල ඉඩමෙහි අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනවසරයෙන් බහුකාර්යය ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද, සභාව ඒ සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ). ප්‍රාදේශීය සභාව සතු පුස්සැල්ල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක බදුකරු විසින් අනවසරයෙන් කොටසක් එකතු කර නිවසක් ඉදිකර තිබුණු අතර,එම භූමියේම කඩකාමර අසළ තවත් බාහිර පුද්ගලයෙකු විසින්ද අනවසර ඉදිකිරීමක් කරගෙන යන නමුත්, එම ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව කිසිදු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) සභාවේ ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් සමීක්ෂණය කල යුතු වුවත්,1987 වර්ෂයෙන් පසු සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වසර 04කට වැඩි කාලයක සිට අක්‍රීයව පැවති රු.395,000ක් වූ වාහන 02ක් වෙන්දේසි කිරීමට හෝ භාවිතයෙන් ඉවත් කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ආ). 2008 වර්ෂයේ සිට බදු දීමට කටයුතු නොකර ගුරුබැබිල අංක 03 දරන කඩකාමරය වසා දමා තිබුණි.

(ඇ). 2008 වර්ෂයේ සිට රු.780,000ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය හා රු.181,500ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය නිශ්කාර්යව පැවතුණු අතර,අංක සීපීඑල්කේ-9597

දරන ටිපර් රථය හා සීපීජේබී-2773 දරන ට්‍රැක්ටරය ආදායම් ඉපයීමේ කාර්යයන් සඳහා යොදා නොගෙන නිශ්කාර්යව ගාල්කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------------
4.1 අභ්‍යන්තර විගණනය
--------------------------
1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
---------------------------------------
2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටු පිහිටු විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එකී කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය
--------------------
සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 08ක රු.696,000ක් වූ ඇස්තමේන්තුගත ආදායම්වලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 20ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 4 සිට සියයට 69 අතර පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 18ක් සඳහා වූ රු.325,000ක සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 36ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම් අතර සියයට 01 සිට සියයට 69 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති සහ ණයහිමි පාලනය